# නේෂන්ස් මෙගා සේවර් ඉතිරි කිරීමේ ගිණුම නියම සහ කොන්දේසි

Nations TrustBank

මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. – පී. කිව් 118 හි විවෘත කර පවත්වාගෙන යනු ලබන නේෂන්ස් මෙගා සේවර් ගිණුම් සියල්ල පහත දැක්වෙන නියම හා කොන්දේසි වලින් පාලනය වේ.

1. එවැනි ගිණුමක් විවෘත කළ හැකි අවම ආරම්භක තැන්පතුව රුපියල් ලක්ෂ පහක් (රු.500,000/=) හෝ කලින් කල බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් මුදලක් වේ.

2. ගිණුම් ශේෂය රුපියල් ලක්ෂ පහකට (රු. 500,000/=) වඩා අඩු වුවහොත් එම ශේෂය මත පොලියක් ගෙවනු නොලැබේ.

3. ගිණුමක ඇති දෛනික ශේෂය මත පොලිය ගණන් බලනු අතර එම පොලිය මාසිකව ගෙවනු ලැබේ.

4.බැංකුවේ තනි හා පරම අභිමතය පරිදි කවර හෝ අවස්ථාවක ඉහත සඳහන් පොලී අනුපාතයන් වෙනස් කිරීමට, අඩු කිරීමට හෝ වැඩි කිරීමට බැංකුව වෙත හිමිකම ඇත.

5. ආයතනික වෙබ් අඩවිය සහ / හෝ ශාඛා නිවේදන සහ / හෝ ප්‍රකාශන පණිවුඩ යාවත්කාලීන කිරීමෙන් ලබා දෙන පොලී අනුපාතවල වෙනස්වීම් හෝ වෙනත් දැනුම්දීම් ගනුදෙනුකරුට ලැබිය යුතු හා ප්‍රමාණවත් දැනුම් දීමක් ලෙස සලකනු ලබන අතර එයට පාරිභෝගිකයා බැඳී පවතී.

6. ගනුදෙනුකරුවෙකු විසින් වසා දමනු ලබන ගිණුම් මත එසේ වසා දමනු ලබන අවස්ථාවේදී එය පවත්වාගෙන යාමේ ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය.

7. යම් ගිණුමක් අවම ශේෂ මුදලක් ඇතිවිට එය අවහිර කර නොතැබිය යුතුය.

8. කවර හෝ අවස්ථාවකදී නේෂනස් මෙගා සේවර් ඉතිරි කිරීම් ගිණුම් අත්හිටුවීමට, ඉල්ලා අස්කර ගැනීමට, අවලංගු කිරීමට සහ/හෝ අවසන් කිරීමටද එම ගිණුම් බැංකුවේ සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම් වශයෙන් සැලකීමටද බැංකුවට හිමිකම් ඇත.

9. මෙම නියම හා කොන්දේසි නේෂන්ස් ඉතිරිකිරීම් ගිණුම්වල නියම හා කොන්දේසි සහ බැංකුවේ වෙනත් සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට අමතර වශයෙන් වන අතර මෙහි සඳහන් නියම හා කොන්දේසි, ඇතුළත් කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට පමණක් එම නියම හා කොන්දේසිවලින් ගනුදෙනුකරු බැඳී සිටී.

10.මෙම නියම හා කොන්දේසි සහ නේෂන්ස් ඉතිරි කිරීමේ ගිණුම්වල නියම හා කොන්දේසි හෝ බැංකුවේ වෙනත් නියම හා කොන්දේසි අතර යම් අනුකූලතාවක් ඇතිවුවහොත් එවිට එම අනුකූලතාවයේ ප්‍රමාණයට පමණක් මෙම නියම හා කොන්දේසි බලපැවැත්විය යුතුය.

ඉහත කී නියම හා කොන්දේසි සහ නේෂන්ස් ඉතිරි කිරීම් ගිණුම් පාලනය වන නියම සහ කොන්දේසි සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි සහ ගිණුම්වලට අදාළ විස්තර මෙහි අත්සන් කිරීමට පෙර මට/අපට ලබාදී පැහැදිලි කරදුන් බවත් එකී නියම හා කොන්දේසි මා/අප කියවා තේරුම්ගත් බවත් එම නියම හා කොන්දේසිවලින් බැඳී සිටීමට එකඟ වී කැමැත්ත ප්‍රකාශ කරන බවත් මම/අපි මෙයින් ස්ථිර කරමි/කරමු.

..............................................................................

අත්සන

නම :

..............................................................................

අත්සන

නම :